# ඇරයුම

වෙළුම 01 | කලාපය 02 | ත්‍රෛ මාසිකය | අප්‍රේල්-මැයි-ජුනි 2012 | මිල 15/-

ස්ත්‍රීන් හා දරුවන්, ගොඩගසා
ගත් රන් රිදී, (සලකුණු සහිත)
අශ්වයින්, ඔටු ගව මහීෂාදීන්
හා කුඹුරු වතුපිටි ආදිය සඳහා
ඇති (තණ්හාව හා) ආශාව,
ජනයාගේ සිත්ගන්නා පරිද්දෙන්
දක්වනු ලැබේ. එහෙත් ඒවා
වනාහි හුදෙක් මෙලොව (අස්ථිර)
ජීවිතය සඳහා ගැනෙන ද්‍රව්‍ය
(පමණකි) යළිත් පිවිසෙන තැනින්
හොඳ තැන අල්ලාහ් වෙත ඇත.

(අල් කුර්ආන් 3:14)

නුඹලාගේ දෙවියා එකම දෙවියෙකි. අපරිමිත දයාවන්ත, අසමසම කරුණාන්විත ඔහු (අල්ලාහ්) හැර වෙන දෙවියෙකු නැත. (අල් කුර්ආන් 2:163)

**ප්‍රකාශනය හා බෙදා හැරීම**
**ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය(FRCS)**
**තැ.පෙ 1989, කොළඹ.**
**දු.අ: 0115 690717**
**ඊමේල්: arayuma@yahoo.com**

**සංස්කාරක මණ්ඩලය**

අෂ්ෂෙයික් ලෆරුල්ලාහ් (බහ්ජි)

අෂ්ෂෙයික් කලීල් (මදනි)

එම් අජ්මල් රෆීක්

කුර්ෂිඩ් අහමඩ්

ෂෙයික් රිස්වි ෆලීල්

**සෝදුපත් බැලීම**

අන්සාර් ඉම්රාන්

**මෙම සඟරාව සම්බන්ධයෙන් ඔබට ඇති අදහස් යෝජනා චෝදනා අපවෙත ලියා එවන්න. ඔබට ඉස්ලාම් දහම සම්බන්ධයෙන් නොමිලේ තොරතුරු, පොත්පත් අවශ්‍ය වන්නේ නම් අපහා සම්බන්ධ වන්න. එසේම ඉස්ලාම් දහම සම්බන්ධයෙන් ඔබට ප්‍රශ්න තිබේ නම් අපට දුරකථනය ඔස්සේ අමතන්න. එයට පිළිතුරු දීම සඳහා අප ඇපකැප වී සිටින්නෙමු. සතියේ දිනවල ප.ව 12.00 සිට ප.ව 1.00 පහත සදහන් දුරකථන අංකය විවෘත ඇත.**

**දු.අ: 0115 690717**

**ISSN 2012-905X**

**Ayoon Optical**
Direct Importer & Wholesales
Dealers in optical Goods,
Frames, Lenses, Sunglass,
Tools, Etc
PRADA
LEVI'S
Ray-Ban
No: 88, Market,
90/3, Prince Street
Colombo-11
city vision
GUCCI
Tel: 0112454346
Mobile: 0778787989



# සංස්කාරකගෙන්

තිස් වසරක කුරිරු යුද්ධය අවසන් විය. කිසිවෙක් සිහිනෙන්වත් නොසිතූ අන්දමක උතුම් වූ සාමයත් දැඩි සැනසිල්ලත් අද අපගේ මාතෘ භූමියට ලැබී ඇත. පිරිසිදු වාතයත් අගනා මනස්කාන්ත පරිසයත් අපගේ ලාංකීය ජනතාව බුක්ති විඳිති. යුද්ධය අවසන් වීමට පෙර රටේ සියලුම වැසියන් මෙන් නොයෙකුත් මානසික පීඩන වලට ගොදුරුවී සිටියහ. තවත් සමහරුන් අනාථයන් විය. තවත් සමහරුන් සරණාගතයන් විය. යුද්ධයට ගොදුරු වූවන්ගෙන් ඇතැම් වැන්දඹුවන් අද වන තෙක් කිසිවක් කර කියා ගත නොහැකිව තම ජීවිතය ප්‍රශ්නාර්ථයක් බවට පත් කරගෙන ඇත්තාහ. එදා බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අපගේ මාතෘ භූමිය දෙසට කිසිදු බටහිර රටක් මනුෂ්‍යත්වයෙන් බැලුවේ නැත. මනුෂ්‍යත්වයක්ම නොමැති බටහිරවාදීන් අද දෙමළ ජනතාවගේ ගැළවුම් කරුවෙක් සේ පෙනී සිටීම ආශ්චර්‍ය ගෙන දෙන්නකි.

මොවුන්ගේ සත්‍ය ස්වරූපය නොදන්නන් සිතය හැකි, ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලය යනු මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටින සංවිධානයක් යනුවෙනි. ඇත්ත වශයෙන්ම මොවුන්ගේ සැබෑ ස්වරූපය එය නොවේ. කිසියම් රටක් බටහිර න්‍යාපත්‍රයට අනුව ක්‍රියා නොකරන්නේ ද එම රට තුළ මානවහිමිකම් උල්ලංඝනය වන ආකාරයේ සිදුවීම් මොවුන්ම ඇති කරති. ඒ සඳහා දේශපාලන පක්ෂ මෙන්ම රාජ්‍ය නොවන UN රූකඩ සංවිධාන ද යොදා ගනියි. නියත වශයෙන්ම UN යනු ලෝකයේ කඩා වැටෙන ආගමකට අයත් රටවල් බොහෝමයකින් සැදුම්ලත් සංවිධානයකි.

ශ්‍රී ලංකාව දෙස බලන UN ලෝකයේ වෙනත් රටවල් දෙස බැලුවාද යන්න අධීක්ෂණය කර බැලුවහොත් 'නැත' යැයි පැවසීම හැර වෙනකක් නැත. ශ්‍රී ලංකාවේ දෙමළ අහිංසක තරුණයින්ව උසිගන්වා ත්‍රස්තවාදය පෝෂණය කර රජයට විරුද්ධ සටන් වදින්නට සැලැස්වූවේ ද UN නරියන්ගේ ගෝලබාලියින්ය. දෙමළ ජනයාව තමන්ගේ රූකඩයක් බවටම පත් කර ගත්තේය. අවසානයේ අහිංසකයින්ව අතරමං කළේය. නැවත දෙමළ ජනතාව අතර යෑමටත් නැවත තමන්ගේ රැගුම රඟදැක් වීමටත් ජනීවා සමුළුව උපයෝගී කරගන්නේය.

මානව හිමිකම් සම්බන්ධයෙන් දඟලන නරියන් මැදගෙරදිග රටවල්වල කළ කුරිරු දඩයම ලෙස හැරී බැලීමෙන්, ලංකාවේ ජනතාව වන අපට මොවුන්ගේ නිරුවත පැහැදිලිව දිස්වනු ඇත. ඉරාකයට අසාධාරණ ලෙස ඇතුළු වී ජනතාව ඝාතනය කර තමන්ගේ ගෝලබාලයන්ට රජය භාර දුන්හ. එවිට UN ඉදිරපත් වූයේ නැත. ලිබියාවට කළේ කුමක් ද? අසාධාරණ ලෙස ගුවන් ප්‍රහාර එල්ල කළේය. ගුවනින් කැරළිකරුවන්ට අවි ආයුධ දුන්නේය. එවිට UN ද නොමැත. අෆ්ගනිස්තානයේ සැමදාම අහිංසක ජනතාව මරා දමන්නේය. මළ සිරුරු මත මුත්‍රා කරන්නේය. ස්ත්‍රීන් දූෂණය කරන්නේය. එවිටද UN නිහඩය. ඇමරිකානු දඩයම් බල්ලාට ගෞරව කරමින් සිටි මෙම UN, පාකිස්තානයට ඇතුළු වී නැති පුද්ගලයෙකුව සොයා පාකිස්තානු අණ්ඩුවට කොකා පෙන්නුවේය. ඉන්පසුවත් පාකිස්ථානයට ගුවන් ප්‍රහාර එල්ල කළේය. ඇතැම් පිරිස් තමන්ගේ ගැලවුම් කරුවන් සේ සිතා ගන්නා ඇමරිකාවේ සැබෑ නිරුවත මෙයම වන්නේය.

දැන් ඔබට වැටහෙනු ඇති කාලයෙන් කාලයට මුස්ලිම්වරුන් ආධිරාජ්‍යවාදින්ට විරුද්ධව පෙළ ගැසෙන්නේ ඇයි ද යන්න. අපි ශ්‍රී ලාංකිකයන් වන්නෙමු. අප අතර ප්‍රශ්න නැතුවා නොවේ. එය අපට සාකච්ඡාමය ස්වරූපයෙන් විසඳා ගැනීමට බොහෝ අවස්ථා ඇත. රටට ප්‍රශ්නයක් නම් මුස්ලිම් - සිංහල - ක්‍රිස්තියනි යැයි බලා නොසිට එකාමෙන් සිටිය යුතුය.

ඇමරිකාව සහ ඔවුන්ගේ න්‍යාපත්‍රයෙන් හැඩ වූවන්, මාෆියා කණ්ඩායම් ඇති කරන්නේය. සංස්කෘතිය වනසා පුවල් සංස්ථාව විනාශ කරන්නේය. කාමාශාව පුතුරවන්නේය. ස්වෛරී රටවල්වලට සූක්ෂම අන්දමින් ඇතුළු වන්නේය. ගොනාව පෙන්වා ගොනාට අන්දන්නේය. පසුව එම රටේ ආර්ථිකය තමන් නතු කරගෙන ආගම පතුරුවන්නේය. ශ්‍රී ලංකාව තුළ කරමින් හා ඉදිරියටත් කරන්නට යන්නේ මෙය බව අප අවබෝධ කර ගත යුතුයි.

**යා අල්ලාහ්** මෙම සියලු ව්‍යවසන මධ්‍යයේ ජීවත් වන අපව ආරක්ෂා කිරීමට ඔබ හැර වෙන කිසිවෙක් නොමැත.

ඔබට අපගේ සඟරාව ඔස්සේ දැන්වීම් පළ කිරීමට අවශ්‍ය වන්නේ නම් අපට කථා කරන්න.
0113 091951
*උතුම් වූ දාවා මෙහෙවර වෙනුවෙන් අපත් සමඟ අත්වැල් බැඳගන්න.*

# මුස්ලිම්වරුන් ත්‍රස්තවාදීන්ද?

මුස්ලිම්වරුන් බොහෝ දෙනෙක් මූලධර්මවාදීන් සහ ත්‍රස්තවාදීන් වන්නේ ඇයි? මෙය අද බොහෝ දෙනෙක් මුස්ලිම්වරුන් දෙසට ඇඟිල්ල දිගු කොට අසන ප්‍රශ්නයකි.

ලෞකික කරුණු පිළිබඳ තර්ක කිරීමේදීත් ආගම් ගැන තර්ක කිරීමේදීත් සෘජුව හෝ වක්‍රව මුස්ලිම්වරුන් මූලධර්මවාදීන් යනුවෙනුත් දැඩි මතධාරීන් යනුවෙනුත් හඳුන්වනු ලබන්නෝය. ඉස්ලාමයට එරෙහි සතුරන් ලෝකයේ සියලුම මාධ්‍යයෙන් CNN FOX BBC හරහා මුස්ලිම්වරුන් මූලධර්මවාදීන් යනුවෙනුත් දැඩි මතධාරීන් යනුවෙනුත් වැරදි ලෙස හඳුන්වාදීමේ කාර්‍යයේ දැඩිලෙස නියැළී සිටිති. මෙම වැරදි පුවත් ලොවපුරා මුස්ලිම්වරුන් පහර කෑමට ලක්වීමට හා වැරදි ලෙස විවේචනයට ලක්වීමට හේතු සාධක වන්නේය. නිදසුනක් ලෙස ඇමරිකාවේ ඔක්ලහාමා නගරයේ බෝම්බ පිපිරීමේ පසුබිමෙහි මැදපෙරදිග රටවල්වල ක්‍රියාකාරීත්වය තිබෙන බව ඇමරිකාවේ සියළුම මාධ්‍යයන් තරඟයට මෙන් දැනුම් දුන්නෝය. එහෙත් එම බෝම්බ පිපිරීමට මුල් වූ වුදිතයා ඇමරිකානු හමුදාවට අයත් පුද්ගලයකු බව පසුව සොයා ගනු ලැබීය.



එසේම ඇමරිකාවේ ලෝක වෙළෙඳ සංකීර්ණයට එල්ල වූ 9/11 ප්‍රහාරය ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ උසමා බින් ලාදින් ගේ කරපිට දැම්මත්, උසමා බින් ලාදින්ට අවි ආයුධ පුහුණු ලබාදී ජාත්‍යන්තර මොළකාරයෙක් බවට පත් කළේද ඇමරිකාවයි.

එසේම ඉරකායේ න්‍යෂ්ටික ක්‍රියාකාරකම් සිදුවන බවත් එම රට තුළ න්‍යෂ්ටික අවි තිබෙන බවත් ඒ හේතුවෙන් කලාපයේ රටවල්වලට මහත් තර්ජනයක් පවතින බවක් පවසා ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ විශාල ප්‍රචාරයක් ගෙන ගියේය. අවසානයේ එම රටට නොකඩවා ප්‍රහාර එල්ල කර සෑම අස්සක් මුල්ලක් පාසා න්‍යෂ්ටික අවි සෙව්වත් අද වනතෙක් න්‍යෂ්ටික අවියක්වත් සොයා ගැනීමට නොහැකි වී තිබේ.

මීළඟට මුස්ලිම්වරුන්ට එරෙහිව නගනු ලබන මූලධර්මවාදය පිළිබඳව හා දැඩි අන්තවාදය පිළිබඳව විමසා බලමු.

## මූලධර්මවාදය පිළිබඳ වූ පැහැදිලි කිරීම

තමා නියැළී සිටින මතය දැඩි අධිෂ්ඨානයකින් යුක්තව එම ප්‍රතිපත්තිය තම ජීවිතයේ ඉතාමත් නිවැරදි ලෙස ක්‍රියාවට නංවන තැනැත්තා මූලධර්මවාදියා යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිදසුනක් ලෙස වෛද්‍යවරයෙක් හොඳ වෛද්‍යවරයෙකු ලෙස ප්‍රචලිත වීමට නම් ඔහු නියැළී සිටින වෛද්‍ය ප්‍රතිපත්තීන්වල මූලධර්මයන් දැනගෙන, එම වෛද්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කර එය ක්‍රියාවට නැංවුවහොත් ඔහු ඉතා හොඳ වෛද්‍යවරයෙකු යැයි හඳුන්වනු ලබයි. මෙය වෙනත් වචනයකින් කියනවා නම් වෛද්‍ය ක්ෂේත්‍රයේ ඔහු මූලධර්මවාදියෙකි.

ගණිත අංශයේ නියැලෙන කෙනෙකු හොඳ ගණිතඥයෙකු යැයි ප්‍රචලිත වීමට නම් ඔහු නියැළී සිටින ගණිත මූලධර්මය අනුගමනය කර ක්‍රියාවට නංවන්නේ නම් ඔහු ඉතා හොඳ ගණිතඥයෙකු ලෙස හඳුන්වනු ලබයි. මෙය වෙනත් නමකින් කියනවා නම් ගණිත අංශයේ ඔහු මූලධර්මවාදියෙකි. අධ්‍යාපන අතින් කෙනෙකු හොඳ උගතෙකු ලෙස ප්‍රසිද්ධවීමට නම් ඔහු ඉගෙන ගත් කරුණු වලින් පරිණත වී එය අනුගමනය කර එය ක්‍රියාවට නංවන්නේ නම් ඔහු හොඳ උගතෙකු යැයි හඳුන්වනු ලබයි. මෙය වෙනත් නමකින් කියනවා නම් අධ්‍යාපනික අතින් ඔහු මූලධර්මවාදියෙකි.

## සියලුම මූලධර්මවාදීන් එක හා සමාන අය නොවෙති.

සියලුම මූලධර්මවාදීන්ට එක හා සමාන වර්ණ ආලේප නොකළ යුතුය. සියලුම මූලධර්මවාදීන් යහපත් අය වශයෙන් හෝ අයහපත් අය වශයෙන් වර්ගීකරණය කළ නොහැක. ඔහු නියැලී සිටින අංශය නැතහොත් ඔවුන් විසින් කරනු ලබන ක්‍රියා යනාදිය මගින් ඔවුන් යහපත් මූලධර්මවාදීන් ද නැතහොත් අයහපත් මූලධර්මවාදීන් දැයි වර්ගීකරණය කළ යුතුය. වෛද්‍යවරයෙක් සමාජයට හානි සිදුකරන නිසා ඔහු අයහපත් මූලධර්මවාදියෙකු ලෙස සැලකිය හැකිය. ඒ අතරම හොඳ වෛද්‍යවරයෙක් සමාජයට ප්‍රයෝජනවත් වන බැවින් ඔහු හොඳ මූලධර්මවාදී වෛද්‍යවරයෙක් වශයෙන් සැලකිය හැකිය.

එසේනම් ඕනෑම කරුණක් හොඳින් හදාරා එහි පදනම, ප්‍රතිපත්ති දැනගෙන එය වෙනුවෙන්ම නියැළී සිටින කෙනෙකුට මූලධර්මවාදියෙකු යැයි කිව හැකිය. මෙය ආගමකටද පොදුය. හින්දු ආගමේ ප්‍රතිපත්ති හොඳින් අධ්‍යයනය කරමින් එය වෙනුවෙන් ජීවත් වන පුද්ගලයා හින්දු මූලධර්මවාදියෙකි. ක්‍රිස්තියානි ආගම හොඳින් හදාරා එය වෙනුවෙන්ම ජීවත්වන පුද්ගලයා ක්‍රිස්තියානි මූලධර්මවාදියෙකි. ක්‍රිස්තියානි ආගම හොඳින් හදාරා එය වෙනුවෙන් ජීවත්වන පුද්ගලයා ක්‍රිස්තියානි මූලධර්මවාදියෙකි. එසේ එක් සත්‍ය මුස්ලිම්වරයෙකු වශයෙන් සිටීම පිළිබඳව කිසිවිටෙක ලැජ්ජාවට පත් වීමේ අවශ්‍යතාවක් නැත. ඉස්ලාමීය මූලධර්වාදියෙක් යැයි ප්‍රකාශ කරන මොහොතක් මොහොතක් පාසා මුස්ලිම්වරුන් මානසික තෘප්තියක් ලබා ගනිති. ඊට හේතුව ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති සියල්ලක්ම ලෝකය පුරා ජීවත්වන මිනිස් වර්ගයාට ප්‍රයෝජනවත් වන ඒවා නිසාය. ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති

කිසිවක් මිනිස් වර්ගයාට හානිදායක හෝ මිනිස් වර්ගයාට එරෙහි ඒවා හෝ නොවේ. එහෙත් වැරදි ඒවා යැයි ඇතැම් බටහිර රටවල් හා ඇතැම් දෙස් විදෙස් මාධ්‍ය ඉස්ලාමය පිළිබඳ වැරදි ප්‍රචාරයක් ගෙනයමින් සිටිති. ඔවුන් එසේ කරන්නේ වැරදි ලෙස ඉස්ලාමය අවබෝධ කර ගැනීම නිසයි. උදාහරණයක් ලෙස

12. (ඕ මුහම්මද්!) ඔබගේ රබ් මලාඉකාවරුන් වෙත 'නිශ්චය වශයෙන්ම මා ඔබ සමග සිටිමි.
එහෙයින් ඔබ විශ්වාසවන්තයින්ව ශක්තිමත් කරන්න' (යැයි අණ කර) 'ප්‍රතික්ෂේප කරන්නන්ගේ
හදවත්හි මා තැතිගැන්ම දමන්නෙමි. එහෙයින් ඔබ ඔවුන්ගේ ගෙල මත කපන්න. ඔවුන්ගේ
(සිරුරෙහි ඇති) පුරුක් සිඳ දමන්න' යැයි දැන්වූ සැටි (මෙනෙහි කරන්න) **(අල් කුර්ආන් : සූරා අන්ෆාල් :12)**

එසේම **(අල් කුර්ආන් : සූරා අන්ෆාල් : 12)** මෙම අල් කුර්ආන් වාක්‍ය, ඉස්ලාම් දහම සම්බන්ධයෙන් වැරදි වැරදි අවබෝධයක් ඇති පුද්ගලයන් උපුටා දක්වයි. සැබවින්ම මෙහි අර්ථ ගැන්වෙන්නේ **මරන්න** යන්නයි. **මරන්න** යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ කුමක් සඳහා ද යන්න අප සොයා බැලිය යුතුයි. මෙම අල් කුර්ආන් වාක්‍යය මුහම්මද් නබි තුමා (සල්ලල්ලාහු අලෙයිහිව සල්ලම්) වෙත පහළ වුයේ, එතුමා තම ජනතාව බේරාගැනීම සඳහා මානුෂීය මෙහෙයුමක යෙදී සිටි අවදියකය. මුහම්මද් (සල්) තුමාව සහ එතුමාගේ ජනතාව මරා දැමීම සඳහා විරුද්ධවාදීන් යුධ කළහ.(යුධ ප්‍රකාශ කිරීමට පෙර මුහම්මද් නබි තුමාගේ ජනතාව නොයෙකුත් තාඩන පීඩනවලට ලක්ව සිටියහ.) විරුද්ධවාදීන්ට එරෙහිව සටන් කර එය ජය ගැනීම උදෙසාත් මුහම්හද් (සල්) තුමාව ධෛර්‍යමත් කිරීම උදෙසාත් **අල්ලාහ්** විසින් මෙම වාක්‍යය පහළ කරන ලදී.

මෙහි කිසිඳු වැරද්දක් දක්නට නැත. රටක යුද්ධයක් පවතින්නේ නම් අහිංසක ජනතාව ඝාතනයට ලක්වන්නේ නම් යුද්ධය හේතුවෙන් රටේ ආර්ථික කඩා වැටෙන්නේ නම් මෙය අනාගතයට බාදාවක් නම් රට වෙනුවෙන් තම ජනතාව වෙනුවෙන් රණ බිමේ සිටින රණවිරුවන්ව ධෛර්‍යමත් කිරීම එම රටේ ජනාධිපති තුමාගේ වගකීමක් මෙන්ම යුතුකමක් ද වන්නේය. රටේ නායකයෙක් එසේ කිරීම සාධාරණ නම් මෙම විශ්වයම නිර්මාණය කර එය පාලනය කරන **අල්ලාහ්** අසාධාරණයට එරෙහිව සටන් කරන ජනතාවට ඉහත ආකාරයෙන් පැවසීම සාධාරණය. විචාරාත්මකව සිතන්නට හැකි පුද්ගලයෙකුට මෙහි වැරැද්දක් දැකීමට නොහැකිය. මෙසේ අල් කුර්ආනයේ වාක්‍ය ගණනාවක් ඇත. ඒ සියල්ලක්ම අවස්ථාව හා පසුබිම අනුව පහළ වු වාක්‍යනය. යමෙකු ඉස්ලාම් දහම කියාපාන කරුණු විවෘත මනසකින් ඉතා කල්පනාකාරීව විශ්ලේෂණය කළේ නම් තනි පුද්ගලයාට මෙන්ම මුළු මහත් මිනිස් සමාජයටම ප්‍රයෝජනවත් වුවකි යන සත්‍යතාවය වටහා ගැනීමට දිගු කලක් ගත නොවනු ඇත.

කණගාටුවට කරුණ නම් මුලධර්මවාදයට **ඔක්ෆර්ඩ් ඩික්ෂනරිය** ගෙන දෙන අර්ථය නම් ආගමේ මූලික ප්‍රතිපත්තීන් වෙනස් නොකර ක්‍රියාත්ම නොකර කිරීම. විශේෂයෙන් 'ඉස්ලාමීය ආගමික ප්‍රතිපත්තීන්' යන්නය. මෙම වැරදි අර්ථකතනය හේතුවෙන් මුලධර්මවායින් යැයි හඳුන්වන සෑම විටම බොහෝ දෙනෙකුට සිහිවන්නේ මුස්ලිම්වරුන්වය. මේ දෙයට වගකිව යුත්තෝ බටහිරවාදීන්ය.

# ත්‍රස්තවාදය - මුස්ලිම්වරුන් සහ ජිහාද්

මුස්ලිම්වරයෙකුගේ විශ්වාසයට අනුව මෙලොවේ ජීවත්වන සියළුම සත්වයන් අල්ලාහ්ගේ මැවීම්ය. මෙහි දී මිනිසා හෙවත් මනුෂ්‍ය වර්ගයාට මුල්තැනක් දෙයි. මුස්ලිම්වරයෙකු මෙලොවේ ජීවත් වීමේ දී ඔහුට පැවරී තිබෙන රාජකාරි බොහෝය. එයින් එකක් වන්නේ සාමය හා සාධාරණත්වය පතුරුවාලීමය. කෙනෙකුට අසාධාරණයක් සිදුවන්නේ නම් හෝ සාමය කඩවන සිදුවීමක් සිදුවන්නේ නම් එය දකින අවංක මුස්ලිම්වරයෙක් තමන්ගේ පාඩුවේ සිටින්නේ නැත. එය ඉස්ලාමීය ප්‍රතිපත්තියක් ද නොවන්නේය.

අප කව්රු හෝ බසයක ගමන් කරනවා යැයි සිතමු. බසයේ මගීන් බොහෝ දෙනෙක් ඉන්නවා. එකවරම බසයට ගොඩවුණු මංකොල්ලකරුවන් මගීන්ට තර්ජනය කර බඩු බාහිර ආදිය මංකොල්ල කන්නේ නම් එය වළක්වාලීම එහි සිටින සැබෑ මුස්ලිම්වරයෙකුට වගකීමකි. එයට විරුද්ධව ඔහු නැගී සිටිය යුතුය. මෙය ශුද්ධ වු යුද්ධයයි. මෙය ජිහාදයයි.

කෙනෙකු ජීවත් වන නිවසකට අසාධාරණ ලෙස යමෙකු හෝ පැමිණ තර්ජනය කරන්නේ නම් එයට එරෙහිව නැගී සිටිය යුතුය. නිවටයෙක් නොවිය යුතුය. එය ශුද්ධ වු යුද්ධයයි.

එසේම තමන් ජීවත් රටට විදේශීය රටක් අයුතු ලෙස මැදිහත් වී ආක්‍රමණයක යෙදී විනාශයක් කිරීමට සුදානම් වන්නේ නම් එයට විරුද්ධව ක්‍රියාත්ම විය යුතුය. මේ ආකාරයටම සිදුවු සිදුවීමක් ඇත. මුහම්මද් සල්ලල්ලාහු අලෙහිවසල්ලම් තුමා මක්කාවේ ජීවත් වෙමින් සිටිය දී සතුරන්ගේ බොහෝ තර්ජන ගර්ජන වලට මුහුණ දුන්හ. සත්‍ය ප්‍රකාශ කිරීම යන එකම හේතුව උඩ නබිතුමාණන්ව මක්කාවේ සිට එළවා දමනු ලැබුහ. මුහම්මද් නබිතුමා තමාගේ ජනතාවට සුදුසු පරිසරයක් සොයාගෙන මක්කාවේ සිට මදීනාවට ගියහ. සතුරන් එතනටත් ප්‍රහාර එල්ලකිරීමට සුදානම් වෙද්දී නබි තුමා ද ප්‍රතිප්‍රහාරය සඳහා සුදානම් වුහ. මෙම සටනට සුදානම් වෙද්දී නබි සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම් තුමාණන් තම අනුගාමිකයන්ට විශේෂ ප්‍රකාශයක් කළහ. එනම් යුධ කිරීමේ දී අහිංසක ජනතාවට පීඩා කිරීම නොකළ යුතුය. කාන්තාවන්ට හා වයෝවෘද්ධයන්ට පීඩා කිරීම නොකළ යුතුය. කුඩා දරුවන්ට පීඩා කිරීම නොකළ යුතුය. අන්‍ය ආගමික සිද්ධස්ථානවලට හානි කිරීම නොකළ යුතුය. ගස් කපා දැමීම නොකළ යුතුය. මෙය ද ශුද්ධ වු යුද්ධයකි.

ජිහාද් යනු ආයුධ සන්නද්ධව සටන් කිරීම පමණක් නොවේ. ජිහාද් යන වචනයට වැරදි අර්ථකතනයක් බටහිර මාධ්‍ය ඔස්සේ ගෙන ගොස් ඇත. පෑනෙන් ජිහාද් කළ හැක. අසාධාරණයට ලක් වු ජනයාගේ හඬ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ එළියට ගෙන එම මෙන්ම තමාගේ කථිකත්වයෙන් ද ජිහාද් කළ හැක. පරිගණකය ඔස්සේ ජිහාද් කළ හැක. පැහැදිලිව අවබෝධ කළ යුතු කරුණ නම් ජිහාද් යනු අහිංසක මිනිසුන් මරා දැමීම නොවේ. ආගමික සිද්ධස්ථාන කඩා දැමීම ද ජිහාද් නොවේ. වයෝවෘද්ධයන්ව මරා දැමීම ජිහාද් නොවේ. කුඩා දරුවන්ව මරා දැමීම ජිහාද් නොවේ. නිදහස් රටක අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගැසීම ද ජිහාද් නොවන්නේය. එසේ කරන පුද්ගලයන්ට බටහිරවාදී වචනයක් වන **ත්‍රස්තවාදියා** යන වචනය යොදාගත හැක.

එබැවින් එක් මිනිසෙකු පිළිබඳව හෝ සමාජයක් පිළිබඳ යම් නිගමනයකට එළඹීමට පෙර ඔවුන්ගේ අදහස ද දැනගැනීම අත්‍යවශ්‍යය. දෙපාර්ශවයම විමසා බලා විමසීමෙන් ලැබෙන්නාවු ප්‍රතිඵලය විග්‍රහ කරනු ලැබ ඒ සඳහා වු හේතු සාධක මෙන්ම එම ක්‍රියාවන්වල අරමුණු සියල්ල දැන ගැනීමෙන් පසුව එකී මිනිසුන් පිළිබඳව එකී සමාජය පිළිබඳව එක් ස්ථිර නිගමනයකට එළඹිය යුතු වීම ඉතාමත් වටින්නේය.

# ලංකාවේ මුස්ලිම්වරු

අද ජීවත්වන ඇතැම් පිරිස් අතීතයේ විසූ මුස්ලිම්වරුන්ගෙන් රටට සිදු වූ සේවය පිළිබඳ නොදන්නෝය. අතීතයේ විසූ මුස්ලිම්වරුන් රට ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට මහඟු සේවාවන් කර ඇතිබව ඒ දෙස නැවත හැරී බලන විට ඕනෑම කෙනෙකුට අවබෝධ වන්නේය. අපේ අවාසනාවකට මෙන් ඒ දෙස බලන්නේ ද ඉතාමත් සුළු පිරිසක් පමණී. එවකට මුස්ලිම්වරුන් රටට ඉතාමත් වැඩදායි පුරවැසියන් ලෙස ජීවත් වූ බව පනස් වසරක සමීක්ෂණයකින් අනතුරුව මීට අවුරුදු විසි පහකට පෙර අපේම තවත් විද්වත් පිරිසක් විසින් එය තහවුරු කර කෘතියක් ආකාරයෙන් සකස් කොට එවකට පාඨක අතට පත් කර ඇත. **අපේ මුතුන් මිත්තෝ** නැමැති එම කෘතිය **ඇරයුම** සඟරාවට ලැබීමට සලස්වා ලංකා පුරවැසියන්ට එහි කරුණු ව්‍යාප්ත කිරීමට නොමසුරු සහයෝගයක් ලබාදුන් **MICH** ආයතනයේ සාර්ථක ඉදිරිගමනට ප්‍රාර්ථනා කරමින් මෙම කලාපයේ පටන් ඉදිරියට **ලංකාවේ මුස්ලිම්වරුන්** යන්නෙන් ලිපි පළ කරන්නට අදහස් කරන්නෙමු. එසේම අතීතයේ ජීවත් වූ ඇතැම් විද්වත් මුස්ලිම්වරුන්ගේ **දුර්ලභ ඡායාරූප** ද කොටස් වශයෙන් ඔබට ඉදිරිපත් කරන්නෙමු. පාසල් සිසු සිසුවියන්ට එය ප්‍රයෝජනවත් වනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.



**Sir Razik Fareed** →

← **Mr. A.H Macan Markar L.L.B**



## බේරුවල පෙරිය මුදලි මරෙයික්කාර්

බේරුවල විසූ පෙරිය මුදලි මරික්කාර්ට ක්‍රි.ව 1016 දී සිංහල නරපතියකු විසින් ප්‍රදානය කෙරුණු පෞරාණික තඹ සන්නසකින් උපුටාගත් පහත සඳහන් ඡේදය කෙරෙහි පාඨක ඔබ අවධානය යොමු කරන්න.

**"…..බේරුවල නැව් නැංගුරම් ලෑම නිසාත් ඒවා වෙනත් රටවල් කරා යාත්‍රා කරවා එමඟින් ගමේ අභිවෘද්ධියට මං සැලසීම නිසාත් ප්‍රසාදයට පත් වූ මහා රාජෝතමයාණන් වහන්සේ ඊට ප්‍රත්‍යුපකාර වශයෙන්…. පෙරිය මුදලි මරෙයික්කාර් ගෙන් පැවතෙන පුත්තු හා මුණුබුරෝද ඔවුන්ගේ දරුවෝ ද ජීවිතාන්තය දක්වාම මෙන් ද, බදු මුදල් ගෙවීමෙන් ද නිදහස් වෙති. ඔහුගේ ගෞරවය හා ශ්‍රේෂ්ඨත්වය සදාකල් අනූනව ආරක්ෂා කළ යුත්තේය. ස්වකීය ආගමික සේවාවන් සපුරාලිම සඳහා ඔවුන්ගේ අවශ්‍යතා අනූනව 'මස්ජිද්' ඉදිකිරීමට ඔවුහු බැඳී සිටියි. ඒවා සුරක්ෂිත කළ යුත්තේය. තවද ඒවා උදෙසා ඔවුන් ඉල්ලා සිටින කවරම බිම් පෙදෙසක් හෝ ඔවුනට පවරා දීම ද කළ යුත්තේය.**

**නැව්වලින් ගෙන එනු ලබන බඩු දිවයිනේ ඕනෑම පෙදෙසක වෙළෙඳම් කිරීමට ඔහුට අවසර දෙනු ලැබේ…."**

මෙම යෝනක වෙළෙන්දාගේම ඉල්ලීම පරිදි මෙම සන්නස එම රජු විසින් ඔහුට පිරිනමන ලද්දේය. මෙම ලේඛනය **'සෙම් පොත පත්තිරම්'** යනුවෙන් හැඳින්වෙන බව ඓතිහාසික සාක්ෂි අනුව නිගමන කළ හැක.

පෙරිය මුදලි මරික්කාර්ගෙන් රටට සිදුවූ උදාර සේවය අතිශයින් ඇගයූ එවකට සිටි පාලකයා පහත දැක්වෙන අධිකාර පත්‍රය ඔහුටත් ඔහුගේ පරම්පරාවටත් ප්‍රදානය කළේය.

**"පෙරිය මුදලි මරික්කාර් සහ ඔහුගේ පරම්පරාවේ අය දගගෙයි ලෑමේ දඬුවමෙන් හා මරණීය දණ්ඩනයෙන් ද නිදහස් කරනු ලබති. මහාරාජෝත්තමයාණන් වහන්සේගේ රාජ්‍යයට දක්වන ලද අනුග්‍රහය වෙනුවෙන් මෙම ගෞරවය මොවුන් වෙත ප්‍රදානය කෙරෙයි.**

**තවද සියළු ගැටළු හා දුෂ්කරතාවලින් මොවුනට ආරක්ෂාව සැලසීමටත් රජය සදා කල්හිම සැදී පැහැදි සිටින්නේය. සිය ආගම පිළිපැදීමටත් මස්ජිද් ඉදිකිරීමටත් ඔවුනට පූර්ණ නිදහස ඇත්තේය. තමන් කැමති ඕනෑම ඉඩමක සිය පූජස්ථාන පිහිටුවා ගැනීමේ නිදහස ද ඔවුනට හිමිවන්නේය. නැව් නිර්මාණය කිරීමටත්**

→

**ඒ මඟින් අන් රටවල් සමඟ වෙළෙඳාමෙහි යෙදීමටත් ඔවුනට අවසර දෙනු ලැබේ...**

**(අත්සන් කළේ) බුක්මන්**
**(රාජවීර බුක්මන්)**

මොහු ලංකාවේ රජකෙනෙකු නොවන බවත් ප්‍රාදේශීය නායකයෙකු පමණක් වන බවත් ආචාර්ය පෝල් ඊ.පීරිස් මහතා අදහස් කළේය.



ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතා

රජතුමා විෂයෙහි සැලසූ ඉමහත් සේවාව නිසා පෙරියමුදලි මරික්කාර් මහතාට තඹ පතක් (ෂෙම්බු පට්ටයම්) හැඩය ගත් මුද්‍රිකාවක් පිරිනමන ලදී. මෙය සන්තකව සිටි තැනැත්තාට මහත් වරප්‍රදාස අත්වූයේය. මෙම රාජ්‍යනුග්‍රහය නිසා:

(අ) පෙරිය මුදලි මරික්කාර් මහතා දකුණු ඉන්දියාවේ පිහිටි 'සාලි මංගලම්' නම් ප්‍රාන්තයේ සිටණී රජ දෝලාව එසවීම සඳහා හත් දෙනෙකුව කැටුව මෙහි පැමිණියේ ය. ඔවුහු වලි අරසන්ණී වලි මුනිණී වලි අරුණන්" වලි සල්මන්" වල්ලි අරසන්" පරමුත්ති හා වල්ලියන් යන නම් වලින් හැඳින්වෙති"

(ආ) පෙරිය මුදලි මරික්කාර් බේරුවල වාණිජ මූලස්ථානය භාරව කටයුතු කළ අතර අනික් ප්‍රදේශවලින් නවක පදිංචිකරුවන් එහි ගෙන්වා ඒ ප්‍රදේශයේ ජනගහනය වර්ධනය කළේය. දකුණු ඉන්දියාවේ සිට ඔහු කැටුව පැමිණි හත්දෙනා සමඟ රටට එලදායි වූ තවත් බොහෝ අය ද මෙහි අවෝය. සමහරු සන්නාලියෝය. සමහරු පේෂ කාර්මිකයෝ ය. අනෙක් අය වඩුවන් හා වෙළෙන්දන්ය. මෙයින් සතුටට පත් රජතුමා ඔවුනට රටේ පදිංචි වීම සඳහා අවශ්‍ය සෑම පහසුකමක්ම සලසා දුන්නේය. වත්මන් සලාගම ගෝත්‍රිකයින්ගේ මුතුන් මිත්තෝ මොහුය.

යෝනක නායකයා වන බස්තාමියර් ලෙබ්බෙ මේස්ත්‍රියාර් මීරා ලෙබ්බෙ මේස්ත්‍රියාර් ද පෙරිය මුදලි මරික්කාර්ගේ පරම්පරාවෙන් පැවතෙන්නෙකි. ඔහු ක්‍රි.ව 1760 දි සිය පුත් අහමද් ලෙබ්බෙට මරදානා මස්පිදයේ බාරකාරත්වය පැවරුවේය.

**01 කොටස එපමණයි.**

**02 කොටස මීළඟ කලාපයේ........**

*කුර්ෂිඩ් අහමඩ්ගෙන්*
*ස්තුති*
**MICH**

# ඔබගේ අවධානයටයි

**ඔබගේ පරිගණකයේ සිංහල අකුරු ඇතත් නැතත් පිවිසිය හැකි ලංකාවේ එකම ඉස්ලාමීය සිංහල වෙබ් අඩවිය**

**www.sinhalenislam.org**

**පිවිසෙන්න, කියවන්න, අධ්‍යයනය කරන්න, ඉස්ලාම් දහම සම්බන්ධයෙන් ඇති වැරදිමත දුරුකර ගන්න. සත්‍යය සොයා විවෘත සිතින් පැමිණෙන දෙනෙත් වලට හඳුන්වා දෙන්න. යහමග සොයා යන ගමනට ඔබත් අපට සහය වන්න.**

සංස්කාරක මණ්ඩලය

## හැකිනම් දායක වන්න.





- පාරේ කෙළ ගැසීමෙන් වළකිමු.



- පාරේ කසල දැමීමෙන් වළකිමු.
- රෝග බෝවන ස්ථාන පිරිසිදු කරමු.
- සැම විටම පදික වේදිකාවෙන්ම ගමන් කරමු.
- පාර මාරුවීමේ දී කහ ඉර භාවිතා කරමු.
- වාහන නැවතුම් ස්ථානයන්හි පමණක් වාහනය නවත්වමු.
- මහ පාරේ ගලක් තිබුණත් එය අයින් කරමු.



- පොදු ස්ථාන වල විනීතව හැසිරෙමු.




- සැමටම ආදරය කරමු.



# ලෝකයේම උතුම් ආදරයට උරුමකම් කියන්නන් යැයි සිතා ගන්නා ආදරවන්තයිනි,

**ආගම දහමට ඇලුම් කරන්නේ නැත්නම්,**
**එය පිළිපදින්නට අකැමැතිනම්,**
**අපිරිසිදුවීමටම කැමතිනම්,**
**යහපත් පවුලක් සඳහා නොවෙහෙසෙන්නේ නම්,**
**දෙමාපියන්ට ද්‍රෝහිවන්නේ නම්,**
**ඇඟපතේ ලැජ්ජාවක්වත් නැත්නම්,**
**රාගයෙන්ම කල් ගෙවන්නේ නම්,**
**නුඹට ලැබෙන දරුවාත් නුඹවගේම වූයේ නම්**

නුඹලා ලෝකයාට දෙන්නට යන ආදරයේ ඵලය කුමක්ද ?

# “අල්ලාහ්” මුස්ලිම්වරුන්ගේම දෙවියෙක් ද?

දේව විශ්වාසය ඇති පාඨකයිනි!

සමාජයේ බොහෝ දෙනෙකුට දේව විශ්වාසය තිබුණත්, තමන් විශ්වාස කරන දෙවිඳුන් තමන්ට පමණක් අයිති බව විශ්වාස කරති. තවත් සමහරුන් තමන් විශ්වාස කරන දෙවිඳුන් තමන්ගේ රටට පමණක් අයිති බවත් තෝරාගත් ජාතියට පමණක් අයිති බවත් විශ්වාස කරති.

හිතවත් පාඨකයිනි! ඔබ මෙය පිළිගන්නේද?

මම හිතන්නේ ඔබ මෙය පිළිනොගනු ඇති. ඊට හේතුව නම් දෙවිඳුන් යනු මෙම සීමා මායිම් වලටත් වඩා ඔබ්බට ගිය විශ්වාසයකි.

රට, ආගම, ජාතිය වෙනුවෙන් තමන්ගේම මැවීමක් වන මනුෂ්‍යාව කවදාකවත් දෙවිඳුන් වෙන් කරන්නේ නැත. එසේම වෛරය හෝ පරස්පරතාවයක් ඇතිකර නොගන්නේය.

දෙවිඳුන්ගේ ප්‍රේමය මෙන්ම සෙනහස සැමෝටම ලැබෙන්නේය. එහෙත්, දෙවිඳුන්ගේ සැබෑ ප්‍රේමය (100%) ලැබෙන්නේ දෙවිඳුන්ව නිවැරැදි ලෙස අවබෝධ කරගෙන දෙවිඳුන්ව නිවැරැදි ලෙස විශ්වාස කරගත් යහ ක්‍රියා කරන උදවියටය.

එසේ නම් දෙවිඳුන්ගේ සැබෑ ප්‍රේමය තිබෙන්නේ උන්වහන්සේව විශ්වාස කරන පිරිසටය. මෙය කිසිවිටෙකත් එක් ආගමකට හෝ එක් ජාතියකට අයත් වන බව කිසිවෙකුටත් කිව නොහැක.

ධනය ඇති පුද්ගලයන්ට ගෙවල් දොරවල් යානවාහන තිබුණත් දෙවිඳුන් ඔවුන්ට අයත් යැයි කිව නොහැක. එහෙත් කිසිඳු සම්පතක් නොමැති පුද්ගලයකු දේව විශ්වාසයේ මුල් තැන හිමිකරගෙන සිටින්නට පුළුවන්.

ඇතැම් පිරිස් “**අප පමණයි දෙවිඳුන් විසින් තෝරාගත් ජනතාව, අප ජීවත් වන භූමියයි පුදබිම**” යැයි පවසති.

ඇතැම් ආගම් වල පූජාවන් පවත්වන විට ධනවතුන්ට මුල් තැනක් දෙන්නේය. අධික වශයෙන් දායක මුදල් ලබාදෙන්නේ නම් ඔවුන්ටත් මුල් තැනක් දෙන්නේය. එසේම තවත් පිරිසකට තමන් විශ්වාස කරන ආගම අදහන්නට බොහෝ වියදම් කරන්නට සිදුව ඇත. ඔවුන් දුප්පත් වුවත් එසේමය.

හිතවත් පාඨකයිනි!

ඉහත කරුණු දෙස අවධානය යොමු කරන ඔබට දෙවිඳුන්ට ආගම් හා රටවල් අයිතිකර උන්වහන්සේට යම් සීමා මායිම් ලබා දීම වැරදි බව වැටහෙනු ඇති. එසේම ධනවතුන්ට දෙවිඳුන් ඉදිරියේ මුල්තැනක් දීම නිවැරැදි නොවන බවත් ඔබට වැටහෙනු ඇති.

ලෝකයේ එකම රට එකම ආගම එකම ජාතිය යැයි ලෝකෙටම පොදු එක් ආගමක් තිබෙන්නේ ද?

දෙවිඳුන් සැම රටටම අයිතියි.

සැම ජාතියටම සැම භාෂාවකටම අයිතියි.

ජාති භේද බැලීමෙන් දෙවිඳුන්ව වෙන්කිරීම නොකළ යුතුය.

ලෝකයේ සැම මිනිසෙකුම එකම දෙමව්පියන්ට අයිති පිරිසකි.

ධනය නැත්නම් සමාජ පිළිගැනීම මහ ලොකු දෙයක් යැයි විශ්වාස කිරීම නොකළ යුතුයි. දෙවිඳුන්ගේ ප්‍රේමය හෙවත් සෙනහස ලබා ගැනීමේ එකම මග උන්වහන්සේව කිසිඳු තැරැව්කරුවෙකු නොමැතිව විශ්වාස කිරීමයි.

මෙසේ දෙවිඳුන්ව හඳුන්වා දෙන එකම දහම ඉස්ලාම් පමණි.

ඉස්ලාම් දහම හඳුන්වාදුන් දේව සංකල්පය පිළිබඳ කෙටි හැඳින්වීම ඔබ ප්‍රිය කළේ නම්, දේව ග්‍රන්ථය වන අල් කුර්ආනය කියවන්න. අවුරුදු 1400 කට පෙර මිනිසුන් විසින් සිතීමට පවා නොහැකි කරුණු කාරණා එහි අඩංගු වී ඇත. දෙවියෙකුට මිස වෙන කිසිම කෙනෙකුට ප්‍රකාශ කළ නොහැකි කරුණු කරණා බොහෝමයක් එහි අඩංගු වී ඇත. එහි මග පෙන්වීම ඇත්තේ මුස්ලිම්වරුන්ගේ පමණක් විමුක්තියට නොව මුළු මහත් මිනිස් සමාජයටමය.

එසේම මුහම්මද් නබි සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම් තුමාගේ වදන් වල පරිවර්තන ද කියවා බලන්න.

ලෝවැසියනි!

ඈඩම්ගෙන් පැවත එන ජනයිනි!

මෙසේයි ඉස්ලාම් දහම සමස්ථ ජනයාව ආමන්ත්‍රණය කරන්නේ. එසේම ශුද්ධ වූ පණිවිඩය ලබා දෙන්නේ. මස්ජිද් වලට හෝ සවුදි අරාබියාවේ මක්කමට හෝ දෙවිඳුන් ඉදිරියේ පිළිගැනීමක් හෝ මුල් තැනක් නොමැත.

මෙසේ උපදෙස් ලබා දෙන ඉස්ලාම් දහමට ඔබ ඇලුම් කරන්නේද? ඇලුම් කරන්නේ නම් පහත සඳහන් විස්තරත් කියවන්න.

ඥානය හා යහපත් කරුණු යම් දෙයක් ලබා දෙන්නේ නම් එය ප්‍රතික්ෂේප නොකරන්න. ඥානය දෙන කරුණුවලට ඔබ අවධානය යොමු නොකරන්නේ නම් එය ඔබව අඥානයට රැගෙන යන්නට පුළුවන.

හිතවත් සහෝදර සහෝදරියනි!

මා ඉහත භාවිතා කළ දෙවිඳුන් යන වචනයට මා ඔබට හඳුන්වා දෙන්නට උත්සහ කළේ **අල්ලාහ්** ව පමණක්ම මිස වෙන දෙවියකුව නොවේ. මෙම ලෝකයේ නැමදීමට සිටින්නේ අපෙත් ඔබේත් එකම දෙවිඳුන්වන **අල්ලාහ්** ම මිස වෙන දෙවියෙකු නැත.

ඔබ දැන් සිටින තැනම **අල්ලාහ්** ව විශ්වාස කරන්න.
ඔබගේ සැම දෙයක්ම **අල්ලාහ්** ගෙන් පමණක්ම ඉල්ලන්න.
ඇතැම් මුස්ලිම්වරුන් නිදහසේ ඔළුවේ කිසිම බරක් නැතිව ජීවත් වන්නේ “සැම දෙයක්ම **අල්ලාහ්** බලා ගනීයි” යන විශ්වාසය හේතුවෙනි. එම සැහැල්ලුවට වෛර කරන්නන් ද බොහෝය.

තමන්ගේ අවශ්‍යතාවය ඉල්ලන්නට කාත්කව්රුවත් නැති අසරණ වූ ජනතාවටයි මේ ප්‍රසිද්ධ **ඇරයුම**. ඔබ දැන් සිටින තැනම **අල්ලාහ් හැර මට නැමදීමට හෝ උදව් කිරීමට වෙන කිසිවෙකු නැත** යැයි විශ්වාස කරන්න.



අබූ*

එවේලෙම පොළොව මත හිස තබා ප්‍රශ්න රැසකට කොටු වී සිටින ඔබ **අල්ලාහ්** ගෙන් ප්‍රාර්ථනා කරන්න. හිතට දැඩි සහැල්ලුවක් හා මනසට ධෛර්යක් ඇති වනු නියතය. **අල්ලාහ්** ගේ කැමැත්ත කෙසේ වේද ඒ අනුව ඔබට ප්‍රතිඵල ලැබෙනු ඇත.

**අල්ලාහ්ගේ අවසරයෙන්ද කලින් නියම කරන ලද වේලාවකදී ද මිස කිසිවෙකුට (කිසි කලෙක) මිය යා නොහැක. යමෙකු මෙලොව ප්‍රතිඵල සඳහා උත්සහ දරන්නේ ද අපි ඔහුට මෙහිදීම එය ලබාදෙමු. පරලොව දී ප්‍රතිඵල සඳහා යමකු උත්සහ කරයි ද ඔහුට එහිදී එය ලබාදෙමු. අපි කෘතවේ දී (සේවකයි)න්ට තිළිණ පිරිනමමු. (අල් කුර්ආන් 3:145)**

# නබි වදන් වලින් ස්වල්පයක්

## ඍජු මග හා වැරදි මග කරා කැඳවීම

කවරෙක් ඍජු මග කරා කැඳවන්නේ ද එම ඍජු මාර්ගයේ ගමන් කරන අයට ලැබෙන සමාන පිනක් ඔහුට අත්වන්නේය ඔවුන්ගේ හොඳ ප්‍රතිඵලවලින් ද කිසිදු අඩුවක් නොකෙරේ කවරෙක් වැරදි මාර්ගය කරා කැඳවන්නේ ද ඔහුට වැරදි මාර්ගයේ යන අයට සමාන පාපයක් අත්වන්නේය ඔවුන්ගේ පාපයන්ද කිසිදු අඩුවක් නොවේ

(ග්‍රන්ථය:මුස්ලිම්)

## ජනයා අතර සාමය ඇති කිරීම

තිසුන් අතර සමාදානය ඇති කරනු පිණිස (ඒ අවස්ථාවේ) යහපත් දෙයක් කියා දෙන්නේ නම් නැත්නම් මතක් කරයි නම් (එය බොරුවක් වුවත්) ඔහු බොරුකාරයෙකු නොවන්නේය

(ග්‍රන්ථ:බුහාරි - මුස්ලිම්)

## ලද දෙයින් සතුටු වීම

අධික වස්තුව හිමි වීම පොහොසත්කමක් නොවේ (සත්‍ය වශයෙන්ම) පොහොසත්කම වන්නේ ධනාත්මක සිතයි (පිරුණු සිතයි)

(ග්‍රන්ථ:බුහාරි - මුස්ලිම්)

## සැහැල්ලුවෙන් කටයුතු කිරීම

(ජනතාව සමගා) කාරුණික වන්න තදින් කටයුතු නොකරන්න සුභ පතන්න (ඔවුන්ව) ප්‍රතික්ෂේප නොකරන්න

(ග්‍රන්ථ:බුහාරි - මුස්ලිම්)

## සභාවක විනයගරුක වීම

ඔබලාගෙන් කෙනෙක් වාඩි වූ තැනින් නැගිට ගොස් ආපසු පැමිණිය හොත් එතැන වාඩිවීමට වඩාත් සුදුස්සා වන්නේ ඔහුමය

(ග්‍රන්ථය:මුස්ලිම්)

## අසාධාරණකම් කිරීමේ තහනම

යමෙක් ජීජනතාව විනාශ වේවා යි කියයි නම් ඔහු ද ඔවුන් සමග විනාශ වන්නේය

(ග්‍රන්ථය:මුස්ලිම්)

# 2012 ස්ත්‍රී දූෂණ අඩු කරමු ද? වැඩි කරමු ද?




ඉහත සඳහන් වන්නේ අප ජීවත් වන ලංකාවේ 2011 අවුරුද්දේ සිදු වූ ස්ත්‍රී දූෂණ පිළිබඳ ජාතික පුවත්පතක පළ වූ දැන්වීමක කොටසයි. ස්ත්‍රී දූෂණ 1636 ක්. බහු ආගමික පරිසරයක ජීවත් වන අපට මෙම පුවත අනිවාර්‍යයෙන්ම විශ්ලේෂණය කළ යුතු වගකීමක් තිබෙන්නේය. ඊට හේතුව නම් කාන්තා විමුක්තිය - කාන්තා නිදහස සම්බන්ධයෙන් කථා කරන ඇතැම් උදවිය මේ සම්බන්ධයෙන් මුණිවත රකින බැවිනි.

2011 වර්ෂයේ දූෂණයට ලක්ව ඇති බොහෝ කාන්තාවන් අවු 18ට අඩු අය වගේම තමන්ගේ කැමැත්තෙන් චූදිතයාගේ ගොදුර බවට පත් වූ අයයි. අවුරුදු ගණනාවක් ස්ත්‍රි දූෂණය මැඩ පැවැත්වීමට නොයෙකුත් ක්‍රියා මාර්ග බලධාරීන් හා විද්වතුන් ගෙන ගියත් මෙය නැවතුණු බවක් නොපෙනේ. අපට වැරදුණේ කොතනද? අප හදාගත යුත්තේ කෙසේද? මෙය සංවිධානත්මක දෙයක් ද?

අප නම් කියන්නේ මුළු ලෝකයේ ජනතාවම ආගමකට මුල් තැන නොදෙන එසේත් නැත්නම් නාමිකව ආගම තියාගන්නා පිරිසක් බවට පත් කරන්නට, ලෝකේයේම බිඳ වැටෙමින් සිටින ආර්ථික ප්‍රතිපත්තියක් ඇති හා ආගමක් ඇති පිරිසක් මෙන්ම ලෝකයේ රටක් නැතිව 1967 දී රටක් ඇති කරගත්තන් විසින් මෙය මෙහෙයවන බවයි. තම ආගම පිළිපදිමින් අනුන්ට කරදරයක් නොකොට ජීවත්වන පිරිස සොයමින් ඔවුන්ගේ හැඟීම් අවුස්සන ආකාරයට සූක්ෂම ලෙස විද්‍යුත් මාධ්‍යයන් මෙන්ම නවීන උපකරණ ඔස්සේ එසේම ආහාර පාන වලින් ද මෙම පිරිස මහා සංහාරයක් ගෙනයමින් සිටිති. කොයි රටේ සදාචාරය මෙන්ම සාරධර්ම පැවතෙන්නේ ද එම රටට මොවුන් විශේෂ සැලකිල්ලක් දක්වති. කුඩා කල සිටම භෞතික සැපසම්පත් වලට ආශාකරවා කෙටි කාලීන තෘප්තිය දිගු කාලීන තෘප්තියක් බවට පෙන්වා අපගේ අහිංසක දූ පුතුන්ව ගොදුරක් කරගන්නේ කවුරුන්ද යන්න සොයා බැලීමේ කාලය 2012 අවුරුද්දේ අපට උදාවී තිබෙන්නේය.

රට වටා ගබ්සා මධ්‍යස්ථාන වැටලුවත් රට වටා අසභ්‍ය චිත්‍රපට සහිත CD තැටි සොයා ගත්තත්, රට වටා අසභ්‍ය චිත්‍රපට සහිත ජංගම දුරකථන සොයා ගත්තත්, ගණිකා නිවාස වැටලුවත්, ස්ත්‍රී දූෂණ මෙන්ම විකෘති මානසිකත්වයෙන් පෙළෙන්නන්ව නැති කිරීමට නම් නොහැකිය.

මා ඉහත සඳහන් කළ පරිදි ලෝකයේ කඩා වැටෙන ආර්ථික ප්‍රතිපත්යක් හා අගමක් තියාගන්නා පිරිස මුළු ලෝකයටම පතුරුවා තිබෙන විෂබීජ තිබෙන්නේය. ඔවුන් ඇතැම් විට සිනමා අධ්‍යක්ෂවරුන්ය. ඇතැම් විට ටෙලි නාට්‍ය අධ්‍යක්ෂකවරුන්ය. ඇතැම්විට මේ දෙකේම රංගපාන ප්‍රසිද්ධ නළුනිළියන්ය ඇතැම්විට පරිගණක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ය. ඇතැම් විට ආයෝජකයන් නාමයෙන් රටවල් වලට ගොස් සංචාරක හෝටල් ඉදිකරන්නන් විය හැකිය. එක් එක් වේලාවට එක එක විදිහේ වෙස් ගන්නට මොවුන්ට හැකිය. වෙලාවකට මුස්ලිම්ය. වෙලාවකට බෞද්ධය. වෙලාවකට විප්ලව වාදියාය.

මොවුන් රූගත කරන සිනාමා නිර්මාණවල **ලිවිං ටුගෙදර්** ඇත්තේය. කාන්තාවන්ව අඩ නිරුවතින් අන්දවා ප්‍රේක්ෂකයාව හොල්මන් කරන්නේය. සාරධර්ම පිරි රට මන:කල්පිත ලෝකයකට කැඳවන්නේය. මොවුන්ගේ ප්‍රධාන පිවිසුම් මාර්ගය ඇත්තේ අන්තර්ජාලයේය. දැන් ලංකාවේ අධ්‍යාපනයේ ඉංග්‍රීසි භාෂාවට ද කොහින්හෝ රිංගා ඇත.

මෑතක දී කොළඹ එක්තරා ප්‍රදේශයක බාලවයස්කාර පෙම්වතුන්ට නිදහසේ සිටීමට ස්ථාන සලස්වා දෙන පිරිසක් සම්බන්ධයෙන් තොරතුරු හෙළිවිය. මොවුන්ව මේ තත්ත්වයට පොළඹවන්නේ ද ඉහත සඳහන් පිරිසයි.

- අම්මේ තාත්තේ අපි ආගම් අතරින් වෙනස් වෙන්න පුළුවන් කන්‍යාභාවය යනු හැම ආගමටම පොදු වස්තුවකි.

- ඔබේ ගෙදර සිටි පුංචි දුවල පුතාලට පොහොසත්කමවත් නවීන අංගෝපාංග හසුරුවන විදහවත් ප්‍රසිද්ධවන්නේ කෙසේ ද යන්නවත් උගන්නට ප්‍රථම එයින් සිදුවන අනිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් ප්‍රථමයෙන් උගන්වන්න.

- මගේත් ඔබේත් පොදු සතුරාවන්නේ කවුරුන් ද යන්න මගේ අකුරෙන් හඳුනා නොගෙන විමසිලිමත්ව සතුරා හඳුනා ගන්න.

- ඔබේ දුවල පුතාලා නිකරුණේ තවත් තරුණ පිරිසක් සමඟ කල් ගත කරන්නේ නම් විමසිලිමත්ව සිටින්න. ඇතැම් විට ඔවුන් ගොදුරු සොයාගෙන එන නරියන් වෙන්නට පුළුවන්.

- කිසිවිටෙක ගේදොර වහගෙන තනියෙන් සිටින පුරුද්ද ඔබ වගේම දරුවන්ටත් නැති කරගන්න.

- ඔබ මෙන්ම ඔබේ දරුවාට ද විනීතව ඇඳුම් අඳින්න පුරුදු කරන්න.

- ඔබ කාන්තාවක් නම් හැකි සෑම අවස්ථාවකම ලේ නෑයෙක් සමඟම පාරට බහින්න.

- ඔබ සිතන්නේ ඉක්මනින් විවාහ කර දීම මෙම භයානක තත්ත්වයට හොඳම විසඳුම යන්න, නොපැකිලිව එම තීරණය ගන්න. විවාහ දිවියෙන් පසු අධ්‍යාපනය ලබන බොහෝ පිරිස් අදටත් සිටින්නේය.

• ඔබ පිරිමියෙක් නම් අනවශ්‍ය ලෙස නිකරුණේ අන්‍ය කාන්තාවක් සමග කතාබස් නොකරන්න. ඇතැම් විට ඔබ නොදැනුවත්වම එය ස්ත්‍රී දූෂණයට පොලොඹවන්නට පුළුවන්. ("මම එහෙම නෑ මගේ හිත ඒවගේ නෙවෙයි" යැයි ඔබ කීවත් ඔබව නිෂ්පාදනය කළ නිෂ්පාදකයා පවසන්නේ මනුෂ්‍ය ස්වභාවයට අනුව පිරිමියා ගැහැණියට කොහොමත් අලුම් කරන බවයි.)

• ඔබේ පුතා හෝ දුව නවීන පන්නයේ ජංගම දුරකථනයක් හෝ පරිගණයක් භාවිතා කරන්නේ නම් සෑම විට ඔහු ඒ ඔස්සේ කරන්නේ මොනවාද යන්න අවධානයෙන් සිටින්න.

• ඔබේ පවුලේ වැන්දඹුවක් හෝ විවාහ වියේ පසුවන තරුණයෙක් සිටියි නම් පුළුවන් ඉක්මනින් ඔවුන්ට විවාහයක් කර දෙන්න.

ඔබ මීට වඩා වෙනත් දෙයක් බලාපොරොත්තු වන්නේ ද? එසේ නම් මීටත් වඩා පුළුල් වූ කරුණක් සම්බන්ධයෙන් කරුණු පහදා දෙන්නම්.

මම පිරිමි කෙනෙක්. කියවන ඔබ ඇතැම් විට කාන්තාවක් හෝ පිරිමියෙක් වෙන්නට පුළුවන්. අපි දෙන්නවම නිෂ්පාදනය කරපු කෙනෙක් ඉන්නවා. අපි අහසින් වැටුණු අය නෙවෙයි. ඒ අහසටත් අයිතිකරුවා. උන්වහන්සේ කාලයෙන් කාලයට මාර්ගෝපදේශයන් මෙලොවට ලබා දුන්නා. සමහරක් අය ඒවා ප්‍රතික්ෂේප කළා. තවත් අය ඒක පිළිගත්තා. පිළිගත් ඇතැම් අයද මුතුන් මිත්තන්ගේ අදහස් ඒකට එකතු කළා. පරිශුද්ධව තිබූ මාර්ගෝපදේශය තමන් අතින් ඔවුන් කාලයක් යනවිට විනාශ කරගත්තා. කව්රු විසින් වුවත් වෙනස් කළ නොහැකි අයුරින් විශ්වයේ අයිතිකරු අවසාන වශයෙන් මාර්ගපොදේශයක් ලබාදුන්නා. ඒක තමයි අපි **අල් කුර්ආනය** කියන්නේ.

මේ අල් කුර්ආන් කියන මාර්ගෝපදේශය ලබාදුන්නේ අපව මවපු, අපේ අඩුපාඩු හොඳින් දන්නා, අපගේ හැකියාව දන්නා, අපේ නිෂ්පාදකයා වන **අල්ලාහ්** ගෙන් නිසා මෙහි දෙන උපදෙස් කවදාවත් වරදින්නේ නැහැ. හැබැයි **අල්ලාහ්** ගේ මාර්ගෝපදේශය නාමිකව පිළිගෙන ලෝකයේ කඩා වැටෙන අර්ථික ප්‍රතිපත්තිය පිළිගත් හා කඩා වැටෙන ආගමේ එක් එක් කොටස් තම ජීවිතයට එකතු කරගත් අයද නැතුවා නොවේ. එහෙත් උපදෙස් හරියාකාරව හිතේ ධාරණය කරගත්තොත් ලෝකයේ සිදුවන වැරදි බොහෝමයක් නිවරැදි කරගන්නට හැකියාව තිබෙනවා. ඉස්ලාම් දහමේ මූලිකව අවධාරණය කරන්නේ *දෙවියෙක් සිටින බවත්, එම දෙවියා* ***අල්ලාහ්*** *හැර වෙන කෙනෙකු නොවන බවත්ය. තමන් මෙලොවේ කරන කියන දේ සියල්ලටම මරණින් මතු ජීවිතයේ* ***අල්ලාහ්*** *ඉදිරියේ වගකිව යුත්තෙක් ලෙස සිටිය යුතු බවයි.* මේ දේ සෑම කෙනෙකුම නිසියාකාරව ඉගෙන ගෙන 100% සිතට ධාරණය කරගත යුතුයි. දේව බිය මිනිස් සිතේ නිසියාකාරව කාවැදුණේ නම් ඔහු වැරදි කරන්නට පෙර දෙවරක් සිතන්නේය. මෙය ලෝකයම පිළිගන්නා සත්‍යයකි. කෙතරම් නීති දැම්මත්, පොලිස් මූලස්ථාන ඇති කළත් රටේ සිදුවන අපරාධ අඩුවෙන්නේ නැත.

**මිනිස් සිතේ කවදාද "මෙලොව ජීවිතය සදාකාලික නොවේ. නිත්‍ය වූ ජීවිතය ඇත්තේ මරණින් මතුවටයි, අප කළ කී දේ සඳහා ඵලවිපාක දෙනු ලබන්නේ එදාටයි" යන්න ධාරණය වන්නේ, අන්න එදාට ලෝකයේ අදට දකින වැරදි බොහොමයක් තුරන් වනු ඇත.**

ලෝකයේ කිසිදු සමාජයක නොමැති ආකාරයට කාන්තාවට නිස තැන ලබා දී තිබෙන්නේ ඉස්ලාම් දහම පමණි. ලෝකයේ ප්‍රධාන ආගමක ප්‍රධාන කාන්තාවකගේ නිර්දෝෂී බව සෘජුව ලෝකයාට පෙන්වා දුන්නේ ඉස්ලාම් දහමේ අල් කුර්ආනය පමණී. පහත සඳහන් අල් කුර්ආන් වැකිය කියවා බලන්න.

**මර්යම්ගේ පුත් මසීහ් එක් දූතයකු මිස (අන් කිසිවෙක්) නොවේ. මොහුට පෙරද මොහු වැනිම වූ දූතයින් පැමිණ ගොස් ඇත්තාහ. ඔහුගේ මව ද සත්‍යවන්තියකි. මේ දෙදෙන (සාමාන්‍ය මිනිසුන් මෙන්) අහාර අනුභව කරමින්ම සිටියහ. (මෙය) සාධක කිහිපයකින් ඔවුන්ට අප කෙසේ පැහැදිලි කළෙමුද යැයි (ඕ මුහම්මද්) ඔබ බලන්න. පසුව (සත්‍යයෙන්) ඔවුන් කෙසේ හරවනු ලබන්නෝ දැයිද ඔබ බලන්න. (අල් කුර්ආන්: මායිදා- 75)**

මෙම වාක්‍යය, ඉස්ලාම් දහමේ කාන්තාවක් අවමානයෙන් බේරා ගැනීම සඳහා කොයිතරම් මුල් තැනක් දෙන්නේ ද යන්න ඔබට වැටහෙනවා නියතය. කාන්තාවට සිදුවන හිංසනය අවමානය හැකි පමණින් වළක්වාලීමටයි ඉස්ලාම් දහම කාන්තාවට මෙන්ම පිරිමින්ටත් ඇඳුම් විලාසයක් හඳුන්වා දී ඇත්තේ. මෙම ලිපියෙන් මම කියන්නට උත්සහ දරන්නේ මුස්ලිම්වරුන් සියල්ල සුදනන් බව නොවෙයි. ඉස්ලාම් දහම නාමිකව පෙන්වා වැරැදි කරන බොහෝ දෙනෙක් නැතුවා නොවේ. මෙය ඉස්ලාම් දහමේ වරරැද්දක් නොව එම මනුෂ්‍යාගේ වැරැද්දයි. එම මනුෂ්‍යයාගේ වැරැද්ද දැක සමස්ථ මුස්ලිම් ජනයාට හෝ ඉස්ලාම් දහමට චෝදනා එල්ල කිරීම අප අපටම කර ගන්නා මහ අපරාධයකි.

**(නබි මුහම්මද්) අපි අල්ලාහ් ගැන ද පරමාන්ත දිනය ගැනද විශ්වාස කර ඇත්තෙමුයි කියන අය මිනිසුන් අතර සිටිති. නමුත් (නියත වශයෙන්ම) ඔවුහු විශ්වාස කරන්නෝ නොවෙති.(අල් කුර්ආන්:අල් බකරහ්- 08)**

ඉස්ලාම් දහම කවදාකවත් මිනිසුන්ට අසාධාරණයක් කරන්නේ නැති නිසායි මෙබඳු වාක්‍යය ද අල් කුර්ආනය තුළ අඩංගු වී ඇත්තේ. **අල්ලාහ්** පිළිබඳව අතිශයින්ම විශ්වාස කිරීම යනු කෙනෙකු තවත් කෙනෙකුට 100% ලබා දිය නොහැකි දෙයකි. මෙලොව ජීවිතයේ සෑම දෙයක්ම අවසන් වන්නේය. මහ විශාල මන්දිරයක් අප විසින් ඉදිකළත් අපට නිදා ගැනීමට හැකි වන්නේ එහි පුංචි කාමරයක පමණී. අප ආශා කරන රසවත් කෑමක් අප ආහාරයට ගත්තත් එම අශාව බඩ පිරුණු ගමන්ම අවසන් වෙනවා. ලිංගික ආශාවද එපමණයි. විනාඩි 10කින් හෝ 20කින් සියල්ල ඉවරයි. එසේනම් අප ජීවත්වන්නේ අප නොදැනුවත්වම යම් සීමාවක් තුළයි. මේ දේ අප නියමාකරව තේරුම් ගත යුතුයි. ඒ අනුව ජීවත් විය යුතුයි. එසේනම් පමණයි, සත්වයන්ටත් මනුසයාටත් වෙනස් කමක් ඇත්තේ.

මම නැවත නැවත මතක් කරන්නේ අපව මවපු දෙවිඳුන්ව නියමාකරව තේරුම් ගන්න. ආදරයෙන් බියෙන් හා භක්තියෙන් උන්වහන්සේට හිස නමන්න. නිත්‍ය නොවන මෙලොව ජීවිතයට ආදරය නොකර නිත්‍ය වූ ජීවිතයක් වෙනුවෙන් පිං කරන්න.

**විශ්වාස කරන්න වූත් යහපත් ක්‍රියාවන් කරන්නා වූත් අයට අභ්‍යන්තරයේ ගලාබසින ගංගාවන්ගෙන් යුත් ජන්නාත්(ස්වර්ගයේ උයන්වතු) ඇතැයි යන ශුභාරංචිය දන්වනු. එහි ඇති පළතුරු වර්ගවලින් ඔවුනට අනුභව කරන්නට දුන් සෑම විටම මීට පෙර අපට දෙනු ලැබුවේ ද මේවා යැයි ඔවුහු කියති. (රසින් විවිධ වූ පෙනුමෙන්) සමාන වූ දැය ඔවුනට පිරිනැමුණු නිසාය. තවද එහි ඔවුනට පවිත්‍ර වූ සහකාරියෝද වෙති. තවද ඔවුහු සදාකල්හි එහි වෙසෙති. (අල් කුර්ආන්: අල් බකරහ්- 01)** ●

උමර්













**ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදයෙන් එළිදක්වන ලද CD තැටි ඉහත දැක්වේ. සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් දහම අධ්‍යයනය කරන්නන්ට මෙන්ම කිතුනු දහමත් ඉස්ලාම් දහමත් අතර ඇති සම්බන්ධතා අධ්‍යයනය කරන පිරිසට මෙයින් ගත හැකි කරුණු කරණා බොහෝය. මිලදී ගැනීමට අවශ්‍ය වන්නේ නම් අපට අමතන්න.**










*මිනිස් කමින් ලොව දිනූ උතුම් මුහම්මද් නබි තුමාණෝ* මැයෙන් පැවති රචනා තරගයේ ත්‍යාග ප්‍රධානෝත්සවය පසුගිය දා කොළඹ ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේ පැවැත්විණ. එයට සහභාගී වූ පිරිසෙන් කොටසක් සහ ප්‍රථම ස්ථානය ලැබූ හිමිනමට ත්‍යාග ප්‍රධානය ඡායාරූපයේ දැක්වේ.

مجلة إسلامية باللغة السنهالية تصدر عن جمعية الدراسات الدينية والثقافية وتهدف إزالة سوء التفاهم حول الإسلام بين المسلمين وغيرهم في ضوء مقاصد الشريعة الإسلامية.